# ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ආයතන වලට, පර්යේෂකයින්ට හා පොදු මහජනතාවට ලබාගත හැකි අගනා සේවාවන් පිළිබඳ විමසුමක්

ආර්. එච්. අයි. එස්. රණසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, කැලණිය විශ්ව විද්‍යාලය

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව නැතහොත් ජාතික ලේඛනාගාරය ඓතිහාසික හා සංස්කෘතික වටිනාකමකින් යුත් රජයේ හා පෞද්ගලික ලේඛන සම්භාරයකින් සමන්විත වූ ජාතිය සතු අනර්ඝ වස්තුවකි. එසේම ජාතික ලේඛනාගාරයෙන් සාධක, අධ්‍යාපන, උපදේශක හා ශිල්පීය වශයෙන් මහගු සේවාවන් රැසක් ඉටු කරනු ලැබේ. ලේඛන සම්භාරය හා සේවාවන් පිළිබඳ විමසීම මෙම ලිපියේ අරමුණයි.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සංස්කෘතික අමාත්‍යාංශය යටතේ පවතී. පිහිටා ඇත්තේ කොළඹ 07 රීඩ් මාවතේහි අංක 07 දරණ ස්ථානයෙහිය. කාහටත් පහසුවෙන් ළඟාවිය හැකි පොදු මධ්‍යස්ථානයක පිහිටීම ඉතාම වැදගත්ය. මෙයට යාබදව ජාතික පුස්තකාලය පිහිටා ඇත. කෞතුකාගාර පුස්තකාලය, කොළඹ මහජන පුස්තකාලය, කොළඹ විශ්ව විද්‍යාලය, රූපවාහිනී සංස්ථාව හා ගුවන් විදුලි සංස්ථාව ආදිය මෙන්ම අගනුවර පිහිටි ප්‍රධාන පාසැල්ද නුදුරින් පිහිටා ඇත.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන අරමුණු වනුයේ රාජ්‍ය ලේඛන කළමනාකරණයෙහි උපදෙස් දීම, ස්ථිර සංරක්ෂණය සඳහා රජයේ ලේඛන සමීක්ෂණය, උපචිතය කිරීම, සංරක්ෂණය කිරීම, පර්යේෂණය කිරීම, ප්‍රසිද්ධ කිරීම, තැන්පත්ව ඇති ලේඛන මහජනතාවට කියවීමට සැලැස්වීම, ශ්‍රී ලංකාවේ මුද්‍රණය වන සියළුම ප්‍රකාශන හා ප්‍රවෘත්ති පත්‍ර වල නීතිමය පිටපත තැන්පත් කිරීමේ සුරක්ෂිතාගාරය ලෙස ක්‍රියා කිරීම, පුද්ගලයින් සතුව ඇති ලේඛන හා මුද්‍රිත දේවල් සමීක්ෂණය කිරීම සහ අවශ්‍ය දැය තැන්පතුව සඳහා භාර ගැනීම හෝ ඒවායෙහි පිටපත් ලබා ගැනීමත්ය.

ඉහත සඳහන් අරමුණු සපුරා ගැනීම සඳහා නීති සහ රෙගුලාසි ඇත. ඒවා නම් 1981 අංක 30 දරණ ආඥපනතකින් සංශෝධිතය කරන ලද 1973 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂක පනත සහ ඒ අනුව සකස් වූ නීතිරීති, මුද්‍රණාල ආඥපනත (178 අධිකාරිය), මුද්‍රණකරුවන් සහ ප්‍රකාශකයින් පිළිබඳ ආඥපනත (179 අධිකාරිය), පුවත්පත් ආඥපනත (180 අධිකාරිය) සහ 1988 අංක 77 දරණ ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන පර්යේෂණ මධ්‍යස්ථාන පනත ආදියයි.

මෙම අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ නිපුණතා වලින් හෙබි කාර්ය මණ්ඩලයක් ඇත. එය වෘත්තීය, අර්ධ වෘත්තීය, ශිල්පීය, පාලන සහ වෙනත් යන කොටස් වලින් සමන්විතය. ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ, සහකාර ලේඛනාරක්ෂක, ලේඛන විමර්ශන නිලධාරි යන තනතුරු වෘත්තීය ශ්‍රේණිවලට අයත්වේ. ජාතික ලේඛනාගාරයට 1981 අංක 30 දරණ ජාතික ලේඛනාරක්ෂක සංශෝධිත පනත අනුව සංස්කෘතික ඇමතිතුමා විසින් පත් කරන උපදේශක සභාවක්ද ඇත.

මෙහි තැන්පත්ව ඇති අගනා ලේඛන එකතුව නිසා ජාතික ලේඛනාගාරය සම්පත් මධ්‍යස්ථානයක් ලෙස

පලකනු ලැබේ. අනුරාධපුර යුගයේ සිට මෙරට ලේඛනාගාර පැවති බවට තොරතුරු තිබුනද එම කාලයන්හි වූ ලේඛන වර්තමානයෙහි ආරක්ෂා වී නොමැත. එසේ වුවද බටහිර පාලන යුගයන්ට අයත් ලේඛන සම්භාරයක් මෙහි ඇත. මේවා එක් රැස් වූයේ ඒ ඒ රජයන්හි අවශ්‍යතා මතය. ඒ ඒ අවධි වල ඒ සඳහා ගරුලාසි තිබුණ අතර නීති පණවා නොතිබුණි.

පෘතුගීසීන්ගේ පාලන කාලයට (ක්‍රි. ව. 1505-1658) අයත් මුල් ලේඛන වශයෙන් සැලකිය හැකි ලේඛන කිසිවක් ජාතික ලේඛනාගාරයෙහි නොමැත. ඔවුන්ගේ ලේඛන වලින් කොටසක් යුද වලදී විනාශ වී ඇත. ලන්දේසීන් අතට පත් වූ ලේඛන ද ලන්දේසි ආණ්ඩුකාර වරයෙකුගේ අදූරදර්ශී ක්‍රියා කලාපය හේතුවෙන් ක්‍රි. ව. 1700 දී පමණ විනාශ වූ බවට පාඨක ඇත. එසේ වුවද පෘතුගීසි සමයේ ලංකාව පිළිබඳ ලේඛන ගෝවේ සහ ලිස්බන් නගරයන්හි ලේඛනාගාර වල සුරක්ෂිතව තිබේ. අවශ්‍ය අවස්ථාවන්හි එම ලේඛන වල පිටපත් හුවමාරු සේවා මගින් හෝ මිලදීට එම ලේඛනාගාර වලින් ලබාගත හැක.

මෙහි ඇති පැරණිම ලේඛන වනුයේ ලන්දේසි යුගයට (ක්‍රි. ව. 1640-1796) අයත් ඒවාය. මෙම යුගයට අයත් ලේඛන වර්ග රාශියක් මෙහි තැන්පත් වී ඇත. ඒවා අතර විශේෂ ස්ථානයක් ලන්දේසි තෝම්බු වලට හිමිවේ. තෝම්බු යනු යම්කිසි විස්තරයක් අඩංගු ලේඛන වන අතර මෙම තෝම්බු, පවුල්, ඉඩම්, පාසැල් තෝම්බු වශයෙන් ප්‍රධාන වර්ග තුනක් ඇත. එසේම ලන්දේසීන් විසින් පවත්වගෙන ආ දේශපාලන මණ්ඩල වාර්තා වලින් ඔවුන් මෙරට පාලනය කල ආකාරය මැනවින් පෙනේ. තවද ඔවුන් විසින් නිකුත් කරන ලද විවිධ නියෝග අඩංගු ප්ලැකාට් නැමැති ලේඛන වර්ගයද මෙහි ඇත. එසේම ලන්දේසීන් සහ මහනුවර රජු අතර හුවමාරු වූ ලිපි, දෙරට අතර කෙරුණු දූත ගමන් හා සාකච්ඡා පිළිබඳ විස්තර සටහන්, ඒ ඒ දූතයන් තබා ගන්නා ලද දින සටහන්, රාජ්‍ය රහස් අන්තර්ගත ලේඛන, යුද්ධ කිරීම පිළිබඳ විවිධ ලිපි, දෛනික ලේඛන, පාලනය පිළිබඳ බහාලියාව සමග හුවමාරු වූ ලේඛන සහ අධිකරණ තීන්දු ආදී විවිධ ලේඛන සම්භාරයක් ලන්දේසි රාජ්‍ය ලේඛන ලෙස මෙහි තැන්පත් වී ඇත. ලන්දේසි යුගය පිළිබඳ පර්යේෂණයක් කිරීමට අදාල සෑම ලේඛනයක්ම මෙහි ඇති බව සඳහන් කල හැකිය.

බ්‍රිතාන්‍ය යුගයේ (ක්‍රි. ව. 1796 - 1948) අදාල සෑම රාජ්‍ය ලේඛන වර්ගයක් මෙන්ම බ්‍රිතාන්‍ය යටත් විජිත කාර්යාලය සමග හුවමාරු වූ වැදගත් ලේඛනද මෙහි තැන්පත්ය. මෙහි ඇති වැදගත් ලේඛන අතර 1815 උඩරට බ්‍රිතාන්‍යයනට පවරා දුන් ගිවිසුම සහ 1818 උඩරට කැරැල්ල සම්බන්ධ ලේඛන ද වේ.

මෙහි තැන්පත් බ්‍රිතාන්‍ය යුගයේ ඉඩම් පිළිබඳ ලේඛනද ඉතාම වැදගත්ය. රජයේ ඉඩම් මහජනතාවට බෙද දීම, ඉඩම් වල බිහිවීම, ප්‍රමාණය, මායිම්, පවරා දුන් අන්දම, පැවරීමට හේතු වූ කරුණු, ඒ පිළිබඳ ආණ්ඩුකාරයාගේ සහ ව්‍යවස්ථාදායක මණ්ඩල වාර්තා, ඉඩම් පිළිබඳ නීතිරීති, මුල් අයිතිකරුවන් පිළිබඳ තොරතුරු, ඉඩමෙන් ලැබෙන ඵලදාව, ඒවා සඳහා අයකල බදු, ආදී එකිනෙකට සම්බන්ධ කරුණු පිළිබඳ සෑම තොරතුරක්ම ලබාගත හැකිය. බදු වාර්තා මේ අතර වැදගත්වේ. දිවයිනේ සෑම පෙදෙසකම ඇති ඉඩම් පිළිබඳව මෙහි තැන්පත් ව ඇති කච්චේරි ලේඛන වලින් තොරතුරු අනාවරණය වේ.

එසේම රජයේ විවිධ මුද්‍රිත ප්‍රකාශනද මෙහි ඇත. ඒවා නම් පරිපාලන වාර්තා, සැසි වාර්තා, සංගණන වාර්තා, සිවිල් ලැයිස්තු, ඔල්මනැක්, බිල් බුක්ස්, හැන්සාඩ්, රජයේ ගැසට් පත්‍ර, සිලෝන් මැණුවල්, ආඥා පනත් සහ පාර්ලිමේන්තු පනත් ආදියයි.

බ්‍රිතාන්‍ය යුගයට අයත් සෑම අංශයක් පිළිබඳවම අදාල ලේඛන මෙහි ඇති බැවින් එම යුගයේ ලංකාවේ සුළුම කරුණක් පිළිබඳව වුවද පර්යේෂණය කිරීමට තරම් ප්‍රමාණවත් මූලාශ්‍ර සම්භාරයක් පවතී.

ක්‍රි. ව. 1948 බ්‍රිතාන්‍යයින්ගෙන් නිදහස ලැබීමෙන් පසු මෙරට දේශපාලන සහ පරිපාලන රටාවන්හි සිදුවූ වෙනස්කම් උඩ රජයේ ලේඛන පූර්ව යුගයට වඩා බිහිවිය. මෙරට විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ආයතන සහ කොමිසන් සභාවලින් බිහි වී, සිංහල ඉංග්‍රීසි දෙමළ බස්වලින් ලියැවුණු, ආරක්ෂා කල යුතු යයි තීරණය කරන ලද ලේඛන කාණ්ඩ රාශියක් මෙහි ඇත.

මෙහි රැස්ව ඇති ලේඛන කාණ්ඩ අතර මැතිවරණ ලේඛන වලටද හිමිවනුයේ ප්‍රධාන තැනකි. 1936 සිට 1994 දක්වා පැවති මැතිවරණයන්හි ප්‍රසිද්ධ කල ලේඛන මෙහි තැන්පත්ය.

මෙහි පෞද්ගලික ලේඛන සම්භාරයක්ද ඇත. පුද්ගලයන් සහ පන්සල්වලින් ප්‍රදානය කරන ලද සහ ඔවුන්ගෙන් මිලදී ගත් ඓතිහාසික, සංස්කෘතික සහ ජෛතික වැදගත් කමකින් යුත් ලේඛන සහ ග්‍රන්ථ මේ ගණයට අයත්වේ.

ජාතික ලේඛනාගාරයේ පවත්නා ලේඛන එකතුවේ නීතිමය තැන්පතුවෙන් ලැබෙන ප්‍රකාශනවලටද හිමිවනුයේ විශේෂ ස්ථානයකි. මුද්‍රණ ශිල්පීන්ගේ සහ ප්‍රකාශකයින්ගේ ආඥාපනත අනුව 1885 සිට මේ දක්වා වූ ශ්‍රී ලංකාවේ මුද්‍රිත ප්‍රකාශන සියල්ලක්ම ජාතික ලේඛනාගාරයෙහි තැන්පත්වේ.

ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත අනුව මෙරට පළවන ප්‍රවෘත්ති පත්‍ර ද මෙහි තැන්පත්වේ. ඒ අනුව 1832 සිට වර්තමානය දක්වා ඉංග්‍රීසි පුවත්පත්ද, 1862 සිට සිංහල පුවත්පත්ද, 1864 සිට දෙමළ පුවත්පත් ද, 1927 සිට මලයාලි පුවත්පත්ද මෙහි ඇත. කාලීන වැදගත් කමකින් යුත් දේශපාලනික, සාමාජීක, ආර්ථික, හා සංස්කෘතික කරුණු පිළිබඳ තොරතුරු ලබාගත හැකි ප්‍රධාන මාධ්‍ය වන පුවත් පත් ලේඛන එකතුවේ ඇති ඉතා වැදගත් මූලාශ්‍ර සමුදායක් ලෙස හැඳින්විය හැකිය.

ජනාධිපති ලේඛන සුරක්ෂිතාගාරයද ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙහි ඇති විශේෂ ලේඛන තැන්පතුවක් ලෙස දැක්විය හැකිය. 1981 අංක 30 දරන සංශෝධිත ජාතික ලේඛනාරක්ෂක පනතෙහි දැක්වෙන "ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති වරයකුගේ ධුර කාලය ඉකුත් වූ විට ජනාධිපති කාර්යාලයේ ඇති සියළු පොදු ලේඛන සහ ඡේතන මුද්‍රිත දේ ජාතික ලේඛනාගාරයට පැවරීම ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයාගේ ලේකම්වරයාට අයත් කාර්යයක් විය යුතුය." යන වගන්තිය අනුව අදාල ලේඛන මෙහි රැස්වේ.

පොදු සහ පෞද්ගලික වශයෙන් මෙහි තැන්පත් ලේඛන කොටස් දෙකකි. ජනාධිපතිගේ විධායක බලතල ක්‍රියාත්මක කිරීමේදී බිහිවූ ලේඛන පොදු ලේඛනවලටද ජනාධිපති පෞද්ගලික සම්බන්ධතා පැවැත්වීමේදී බිහි වූ ලිපි පෞද්ගලික ලේඛනවලටද අයත්වේ. එමෙන්ම ජනාධිපතිගේ කථා ඇතුලත් රජයේ ප්‍රකාශන, චලන චිත්‍රපට, ශ්‍රව්‍යදෘශ්‍ය කැසට් පට හා ගුවන් විදුලි සංස්ථාවෙන් ලබාගත් කැසට් පටිද මෙහි තැන්පත්ය. විවිධ රාජ්‍ය නායකයින්ගෙන් සහ අමුත්තන්ගෙන් පරිත්‍යාග වශයෙන් ලැබී ස්ථිර තැන්පත් සඳහා එවන ලද භාණ්ඩ මෙහි ප්‍රදර්ශනාගාරයක තැන්පත් කර ඇත. ඒවා පිළිබඳ ඡායාරූප සහිත නාමාවලියක්ද, දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල ජනාධිපතිට අදාලව පළවූ ලිපි හා වෙනත් තොරතුරු පිළිබඳව සහ හැන්සාඩ් වාර්තාවල සඳහන් ජනාධිපතිගේ කථා පිළිබඳව සූචියක් සාද ඇත.

රාජ්‍ය ලේඛනාගාරයට අයත් ශාඛා කාර්යාලයක් මහනුවර හේමමාලි මාවතෙහි පැරණි කච්චේරි ගොඩනැගිල්ලෙහි උසාවි සංකීර්ණයට සම්බන්ධව පිහිටා ඇත. මෙහිද විවිධ ලේඛන වර්ග සම්භාරයක් තැන්පත්ව ඇත.

දැන් අපි ජාතික ලේඛනාගාරයෙන් කරනු ලබන පාඨක සේවාවන් ගැන විමසමු. විවිධ වර්ගයේ පාඨකයන්ට මෙහි ඇති ලේඛන එකතුව උපාධින්, පශ්චාත් උපාධින්, පර්යේෂණ අවශ්‍යතාවයන්, නෛතික අවශ්‍යතාවයන්, පරම්පරා ඉතිහාසය සෙවීමට ආදී වශයෙන් විවිධ අරමුණු සඳහා පරිශීලනය කිරීමට ඉඩ සලසා ඇත. එහෙත් මෙයින් වෙනස් වන අවස්ථාවන් කිහිපයක්ද ඇත. නීතිමය තැන්පතුවෙන් ලැබෙන පොත් හා වාර සඟරා පරිහරණය සඳහා ඉඩ දෙනු ලබනුයේ වෙනත් පුස්තකාලයකින් එය ලබා ගත නොහැකි නම් පමණකි. එසේම සමහර රජයේ කොමිසන් සභා මෙන්ම පෞද්ගලික ලේඛනද පරිහරණයට අවසර නොදෙන ලෙස හෝ අවුරුදු කිහිපයකින් පසුව පරිහරණයට අවසර දෙන ලෙස දක්වා ඇත්නම් එම නියෝගයන්ද ජාතික ලේඛනාගාරයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙහිද, මහනුවර ශාඛා කාර්යාලයේහිද පාඨකයින් සඳහා සෙවීම් පහසුකම් සලසා ඇත. පාඨකයන්ට දෙන සහායට අමතරව රජයේ දෙපාර්තමේන්තු, පෞද්ගලික ආයතන හා පුද්ගලයන් තැපැල් මගින් හා දුරකථනයෙන් කරන විමසීම් වලටද, විදේශ විමසීම් වලට ද පිළිතුරු සපයනු ලැබේ.

අවසර ලත් පාඨකයන් හට මෙහි පවතින පුස්තකාලය පරිහරණය කළ හැකිය. ලේඛනාගාර හා ලේඛනාරක්ෂක කටයුතු සහ ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳව පොත් සම්භාරයක් තැන්පත්ව ඇත. මිලදී ගැනීමෙන් හා පරිත්‍යාග වශයෙන් ලැබෙන පොත්වලින් මෙම පුස්තකාලය සමන්විතය.

ජාතික ලේඛනාගාරයෙන් කරනු ලබන හුවමාරු සේවාවන් මගින් ඡායා පිටපත් වෙනත් ලේඛනාගාර සමග හුවමාරු කරගනු ලැබේ. මේ සේවාවන් මගින් පර්යේෂකයන්ට මෙහි නොමැති වෙනත් ලේඛනාගාර වල පවත්නා ලේඛන බලාගැනීමට අවස්ථා ලැබේ. මෙයද විශේෂ පාඨක සේවාවන් ලෙස සැලකිය හැකිය.

උධෘත නිකුත් කිරීමද ඉටුකරනු ලබන ප්‍රධාන සේවාවකි. මහජනතාවගේ හා රාජ්‍ය ආයතන වල අවශ්‍යතාවයන් සඳහා මෙහි පවත්නා ලේඛනවලින් සහතික කළ උධෘත නිකුත් කරයි. ගෘහ මූලික ලැයිස්තු, ඡන්ද දායක නාම ලේඛන, රජයේ ගැසට්, පුවත් පත්,

විජය ප්‍රකාශන, විහාර හා දේවාල ඉඩම්, ධාතු බඳු වංශකථා, රජයේ සන්නස්, තෝම්බු ආදිය ප්‍රධාන විෂයයන් උධෘත ලබාගන්නා ලේඛනයි. තමන්ගේ ඉඩම් අයිතිවාසිකම් තහවුරු කිරීමට සහ අනන්‍යතාවය ඔප්පු කිරීමට පොදු මහජනතාව වැඩියෙන්ම උධෘත ලබා ගෙන ඇත. මේයට අමතරව පර්යේෂණ කටයුතු, ප්‍රකාශන සහ මාධ්‍ය කටයුතු සම්බන්ධයෙන්ද විවිධ උධෘත ලබාගනිති.

උසාවි කටයුතු වලදී සහාය වීමද මෙයින් වන විශේෂ සේවාවක් ලෙස දැක්විය හැකිය. රජයේ අවශ්‍යතාවයන් සහ පෞද්ගලික අවශ්‍යතාවයන් සඳහා මෙසේ සහාය වේ. විශේෂයෙන් ඉඩම් අයිතිවාසිකම් සහ අනන්‍යතාවයන් ඔප්පු කිරීම සඳහා අවශ්‍ය වන ලේඛන උසාවිවලට ඉදිරිපත් කරනු ලැබේ. එසේම එම ලේඛනවල අවංකභාවය පිළිබඳව සාක්ෂිදීම සඳහා අවශ්‍ය වූ විට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් උසාවි වලට යනු ලැබේ. ඇතැම් අවස්ථාවන්හි සහතික කරන ලද උධෘත ලියාපදිංචි තැපැලෙන්ද යවනු ලැබේ.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් එහි අරමුණු හා ක්‍රියාදාමයන් පිළිබඳව දැනුවත් කිරීම සහ ප්‍රචාරය කිරීම සඳහා කරනු ලබන විවිධ වැඩ සටහන් වලින් අධ්‍යාපනික වැඩ සටහන් වලට ප්‍රමුඛස්ථානයක් ලැබේ.

ලේඛන කළමනාකරණය පිළිබඳව එක්දින හා ද්විදින පාඨමාලා රජයේ අමාත්‍යාංශ, සංස්ථා, දෙපාර්තමේන්තු, මණ්ඩල වල ඉහළ පෙළේ නිලධාරීන්ට සහ ලිපිකරු ශ්‍රේණිවල නිලධාරීන්ට පවත්වනු ලැබේ. මාණ්ඩලික නිලධාරීන් සඳහා වසරකට එක් දින පාඨමාලා දෙකක්ද, ලිපිකරු ශ්‍රේණිවල නිලධාරීන් සඳහා වසරකට පස්දින පාඨමාලා පහක්ද ඇත. මෙම පාඨමාලාවන්ට ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යයන්, එහි තැන්පත් ලේඛන, ලේඛන පරිපාලනය, ලේඛන කාමර, ලේඛන විධිස්ථාන සහ ලේඛනාගාර පිහිටුවීම, ලේඛන සමීක්ෂණ, සංරක්ෂණය කිරීම හා විනාශ කිරීම, ලේඛන ප්‍රත්‍යුත්පාදනය කිරීම සහ ලේඛන ප්‍රතිසංස්කරණ යන කරුණු ඇතුළත්ය.

රාජ්‍ය ලේඛන පරිපාලනය, සංරක්ෂණය සහ ලේඛනාරක්ෂක නීති ආදිය ගැන වැඩමුළු, ආරාධිත වැඩමුළු, සම්මන්ත්‍රණ සහ දේශන පැවැත්වේ. විවිධ උත්සවයන්හිදී පවත්වන දේශන හැරුණු විට විශ්වවිද්‍යාලීය පාඨමාලා ඇතුළු අධ්‍යාපන සහ වෘත්තීය පාඨමාලා සඳහාද දේශන පවත්වනු ලැබේ.

රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සිය සේවා කටයුතු සහ විවිධ කරුණු අරභයා ප්‍රදර්ශන පවත්වනු ලැබේ. නිදහස් දින, රාජ්‍ය සාහිත්‍ය දින, මහපොල, ගම්උද, ආදී රජය විසින් පවත්වනු ලබන විවිධ උත්සවයන්හිදී මෙන්ම වැදගත් පුද්ගලයන් සමරනු සඳහා පැවැත්වෙන උත්සවයන්හිදීද අදාල කරුණු පිළිබඳව ප්‍රදර්ශන පවත්වයි. එසේම ජාතික ලේඛනාගාරයෙහි ඇති නිත්‍ය ප්‍රදර්ශන ශාලා මගින් මෙරට ඉතිහාසයේ විවිධ කරුණු පිළිබඳව අගනා තොරතුරු විදහා පායි.

තවද ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් 1979 සිට වාර්ෂිකව ලේඛනාරක්ෂක සතිය පවත්වනු ලැබේ. එහි අරමුණු වලට අදාලව විවිධ තේමාවන් යටතේ විවිධ වැඩ සටහන් පවත්වයි. එම සතියේදී රාජ්‍ය නිලධාරීන්, පුස්තකාලයාධිපතිවරුන්, විද්වතුන්, පුවත්පත් කලාවේදීන්, පර්යේෂකයින්, සිසුන් ආදීන් සඳහා සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන පැවැත්වීම, තේමාවේ අගය පිළිබිඹු කරන පෝස්ටරයක් නිකුත් කිරීම, සමරු කලාපයක් නිකුත් කිරීම ආදිය කරනු ලැබේ. සමරු සතිය පිළිබඳව පුවත්පත්වල ලිපි, ගුවන් විදුලි, සාකච්ඡා, රූපවාහිනී වැඩ සටහන් මගින් ප්‍රචාරයක් ලබා දෙයි.

විවිධ රාජ්‍ය උත්සවයන්, ලේඛනාරක්ෂක සතිය හා වෙනත් විවිධ අවස්ථාවන්හිදී දෙපාර්තමේන්තුවේ කාර්යයන් සම්බන්ධයෙන් පුවත්පත්, සඟරා, රූපවාහිනිය, ගුවන් විදුලිය ආදී සන්නිවේදන මාධ්‍යයන් මගින් ප්‍රචාරයක්ද ලබාදෙයි.

එමෙන්ම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අරමුණු සහ කාර්යයන්ට අදාල විවිධ කරුණු පිළිබඳව ප්‍රකාශන නිකුත් කිරීමෙන්ද සැලසෙනුයේ අගනා සේවාවකි. කාලීන වැදගත් කමකින් යුත් පර්යේෂණාත්මක කෘතීන් ප්‍රකාශයට පත් කරනු ලැබේ. වාර්ෂිකව පවත්නා ලේඛනාරක්ෂක සතිය වෙනුවෙන් සමරු කලාපයක් සහ අත්පොත්ද, දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා සේවා පිළිබඳ පත්‍රිකා ද ප්‍රකාශ කරයි. අප මුලින් සඳහන් කල පුවත් පත් ආඥපනත අනුව ලියාපදිංචි කිරීම සඳහා ලැබෙන ප්‍රවෘත්ති පත්‍ර ඇසුරින් "ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත ප්‍රවෘත්ති පත්‍ර නාමාවලියද", මුද්‍රණාල ආඥපනත අනුව ලියාපදිංචි කරනු ලබන මුද්‍රණාල අනුව "ශ්‍රී ලංකාවේ මුද්‍රණ නාමාවලිය" ද වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලැබේ. ආසියාතු ජාතීන්ගේ ඉතිහාසය පිළිබඳ මූලාශ්‍ර වෙළුමෙහි ශ්‍රී ලංකා වෙළුමද අගනා ප්‍රකාශනයකි.

දේශන සහ ප්‍රදර්ශන සඳහා පහසුකම් දළ ජාතික ලේඛනාගාරයෙන් ලබාදෙයි. අගනුවර වැදගත් මධ්‍යස්ථානයක පිහිටීම නිසා මෙම පහසුකම් සැපයීම ඉතාම වැදගත්ය.

රජයේ සහ පෞද්ගලික ආයතනයන්හි ලේඛන සමීක්ෂණය කිරීම, ලේඛන කාමර පවත්වාගෙන යෑම ආදිය පිළිබඳව උපදෙස් දීමද ජාතික ලේඛනාගාරයෙන් ඉටුවන විශේෂ සේවාවකි.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ අනිකුත් ව්‍යවස්ථාපිත ආයතන වල ඇති ලේඛන වලින් ස්ථිර සංරක්ෂණය පිණිස තැන්පත් කිරීම, උපලේඛන ගතවියයුතු ලේඛන තීරණය කිරීම, ලේඛන තැන්පත් කිරීම, වාර්ෂිකව විනාශ කිරීම, ලේඛන අපහරණය කිරීම ආදිය පිළිබඳව ඒ ඒ කාර්යාලවලට ගොස් උපදෙස් දෙයි. මෙම ක්‍රියාදාමයෙහි මූලික අරමුණ වනුයේ ඉතා වැදගත් ලේඛන ඒවායේ රාජකාරී කාල සීමාව අවසන් වූ පසු ජාතික ලේඛනාගාරයට ආබද්ධ කිරීම, අනිකුත් ක්‍රියාකාරී ලේඛන අදාල ආයතන තුල ක්‍රමානුකූලව තබා ගැනීමට හැකි වන සේ පිළියෙල කිරීම සහ අනවශ්‍ය ලේඛන ඒ ඒ අවස්ථාවලදී විනාශ කිරීමය. මෙම කාර්යයන් මගින් ඒ ඒ ආයතනයන්හි දෛනික පරිපාලන කටයුතු ඉතා කාර්යක්ෂමව කරගෙන යෑමට වාතාවරණය සලසා දෙයි. ඕනෑම ආයතනයකට මේ සඳහා උපදෙස් ලබාගත හැකිය.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් සිදුවන සේවාවන් අතර ශිල්පීය සේවාවන් වලටද හිමිවනුයේ ප්‍රධාන තැනකි. ලේඛන ප්‍රතිසංස්කරණ හා සංරක්ෂණ කාර්යයන්, ලේඛන ප්‍රතිරූපන සේවාවන්, ශිල්පීය සේවාවන් සඳහා සහාය දීම මේ යටතේ කරනු ලැබේ.

ලේඛන ප්‍රතිසංස්කරණ හා සංරක්ෂණ අංශයෙන් වෙළුම් සඳහා සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය, අර්ධ ප්‍රතිසංස්කරණය, ප්‍රථමාධාර දීම අධිලේඛන තැන්පත් කිරීම සඳහා පෙට්ටි සැකසීම, ප්‍රවෘත්ති පත්‍ර වෙළුම් බැඳීම සහ වෙනත් විවිධ ප්‍රතිසංස්කරණ කටයුතු කරනු ලැබේ. එමෙන්ම ලේඛන ධූමායනය කිරීමද කරනු ලැබේ.

ජාතික ලේඛනාගාරයේ තැන්පත් ස්ථිර සංරක්ෂිත අධිලේඛන, සංරක්ෂණය සහ මෙහි පැමිණෙන පාඨකයින්ගේ පරිශීලනය නිසා විනාශ වී යෑම වළකාගැනීම සහ අරමුණ ඉටුකර ගැනීම සඳහා අධිලේඛන සූක්ෂම ඡායාරූප ගතකරනු ලැබේ. දහනමවන හා විසිවන සියවස් වල පුවත්පත් වල කඩදාසි දුර්වල බැවින් ද, පරිශීලනයේ දී විනාශ විය හැකි බැවින්ද මෙහි තැන්පත් පැරණි පුවත්පත්ද සූක්ෂම ඡායාරූපගත කරනු ලැබේ. විනාශ වී යා හැකි බැවින් මුල් පුවත් පත් වෙනුවට පාඨකයනට ඒවායේ සූක්ෂම ඡායාරූප නිකුත් කරනු ලැබේ. ඒවා සූක්ෂම ඡායාරූප කියවන යන්ත්‍ර ආධාරයෙන් බැලීමට පහසුකම් සලසා ඇත.

මෙහි පවත්නා ක්ෂණික ඡායාරූප පිටපත් ගැනීමේ සේවාවෙන්ද පාඨකයනට අගනා සේවාවක් ඉටුවේ. ජාතික ලේඛනාගාරයේ තැන්පත් අධිලේඛන වල ක්ෂණික ඡායාරූප පිටපත් සාමාන්‍යයෙන් දෙනු නොලැබුවද, අධිලේඛනය මනා තත්ත්වයේ පවතී නම් පිටු කුතක් පමණ ලබාගත හැකිය. මනා තත්ත්වයේ පවත්නා මුද්‍රිත ප්‍රකාශනයන්හි පිටු දහයක් පමණ ඡායාරූප පිටපත් ලබාගත හැකිය.

එසේම රාජ්‍ය අංශයේ පොත් බඳින්නන් හට පුහුණුවීමේ පහසුකම් සලසනු ලැබේ. මෙම පුහුණුවීම් තුලින් පොත් බැඳීම සඳහා අවශ්‍ය ප්‍රාථමික උපකරණ, පොත් බැඳීමේ ක්‍රම, ලේඛන සංරක්ෂණ කටයුතු, ලේඛන ප්‍රතිසංස්කරණය සහ පවත්වාගෙන යෑම පිළිබඳව දැනුමක් ලබාදෙයි.

රජයේ හෝ පෞද්ගලික ආයතනයන්හි ප්‍රතිරූපණ මධ්‍යස්ථානයන් පිහිටුවීම, ලේඛන සංරක්ෂණය, ලේඛන කාමර හෝ ලේඛන මධ්‍යස්ථාන පිහිටුවීම, පවත්වාගෙන යෑම පිළිබඳව අවශ්‍ය උපදෙස් සහ ශිල්පීය සහාය දෙයි. අවශ්‍ය අවස්ථාවන්හි වෙනත් ආයතන වල ලේඛන ප්‍රතිසංස්කරණ සහ සංරක්ෂණ කටයුතු කර දෙයි. එසේම පුද්ගලයන් සහ පෞද්ගලික ආයතන, සංගම්, පිරිවෙන් සහ විහාර සතු ලේඛන සහ අත් ලිපි සංරක්ෂණය කිරීම සහ ඒවායේ ආරක්ෂාවට උපදෙස් දෙනු ලැබේ.

මේ අන්දමට පාඨක, අධ්‍යාපනික, උපදේශ හා ශිල්පීය සේවාවන් රැසක් ජාතික ලේඛනාගාරයෙන් කරනු ලැබේ. අප සාකච්ඡා කල පරිදි සංස්කෘතික සහ ඓතිහාසික වටිනාකමින් ඇති රජයේ මෙන්ම පෞද්ගලික ලේඛන සම්භාරයක් මෙහි තැන්පත්ය. මතු පරම්පරාවන්ට අපගේ ඉතිහාසය හැදෑරීමට දෙනු ලබන මහගු ජාතික දායාදයක්වන මෙම ප්‍රාථමික මූලාශ්‍ර සම්භාරය එක් රැස්කර, සංවිධානය කර, අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර, ආයතන වලට, පර්යේෂකයන්ට

මෙන්ම පොදු මහජනතාවට පරිශීලනයට අවශ්‍ය පහසුකම් අඛණ්ඩව සැලසීම සහ සේවා වැඩි දියුණු කිරීම වෙනුවෙන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ වත්මන් අධ්‍යක්ෂ ආචාර්ය කේ. ඩී. ජී. විමලරත්න මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට අපගේ ස්තුතිය හිමිවේ.

## මූලාශ්‍ර


1. ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂගේ පාලන වාර්තා.
2. අධිලේඛනාරක්ෂක සතිය වෙනුවෙන් නිකුත් කළ සමරු කලාප.
3. ලේඛන කළමනාකරණය පිළිබඳ පාඨමාලාවන්ට අයත් අධ්‍යාපන වැඩ සටහන්.
4. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් විවිධ විෂයයන් සඳහා නිකුත් කරන ලද පුස්තිකා.
5. කල්පනා. 1988 ජූනි, 7 වෙළුම. 8 වන කලාපය.